# කෘෂි නිෂ්පාදකයන් සංවිධානය කරන සමුපකාර සමිති

ශ්‍රී ලංකාවේ සමුපකාර සංවිධාන පිළිබඳ කථා කිරීමේදී බොහෝ විට ප්‍රමුඛත්වයෙහි ලා සැලකෙනුයේ පාරිභෝගික කටයුතුවලට අදළ සමුපකාර සංවිධාන කෙරෙහි ය. එහෙත් සමුපකාර ව්‍යාපාරයේ ඉතිහාසය සහ අදළ ක්ෂේත්‍රයන්හි සමුපකාර කටයුතුවල වර්ධනය සලකා බැලීමේදී කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හිමිවනුයේ ඉතා වැදගත් ස්ථානය කි.

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික රටක් වන අතර, ආර්ථික වර්ධනය හා ජන ජීවිතයේදී ආර්ථික ස්ථාවරත්වය උදෙසා කෘෂිකාර්මික අංශයේ වර්ධනය ඇති කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. රටෙහි ජනගහනයෙන් 78% ක් පමණ ග්‍රාමීය ජනගහනය වන අතර, සේවා නියුක්ත ජන ගහනයෙන් 45% ක් පමණ කෘෂිකර්ම අංශය නියෝජනය කෙරේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ප්‍රධාන විශේෂිත ලක්ෂණයක් වනුයේ කෘෂිකාර්මික කටයුතු බොහෝ විට කුඩා පරිමාණයෙන් යුක්ත වීම ය. උදහරණයක් වශයෙන් රබර් සඳහා වෙන්ව ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් 50.1% හෙක්ටයාර් 1.6 ට අඩු ඒවා ය. වී සහ පොල් වගා කටයුතු, සම්බන්ධ තත්ත්වයද බොහෝ දුරට එබඳු ස්වරූපයක් ගනී. කිරි නිෂ්පාදන කටයුතු කුකුළන් සහ ඌරන් ඇතිකිරීම වැනි වෙනත් සත්ව පාලන කටයුතු සම්බන්ධවද තත්ත්වය මෙබඳු කුඩා පරිමාණයේ ස්වරූපයකින් යුක්තය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන මෙම කුඩා පරිමාණයේ ස්වරූපය සැලකිල්ලට ගැනීමේදී ඊට ආවේනික පහත සඳහන් දුෂ්කරතාද සැලකිල්ලට ගැනීමට සිදු වේ.

1. නිෂ්පාදන කටයුතුවල වර්ධනය සඳහා අවශ්‍ය අරමුදල් හිඟකම.

2. නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ආදයමින් අදළ යෙදවුම් සඳහා උපයෝගී කර ගැනීමට නොහැකිවීම සහ ඒවා පාරිභෝගික අවශ්‍යතා සඳහා යොදා ගැනීම.

3. මෙම තත්ත්වය නිසා ප්‍රමාණවත් යෙදවුම් නොයෙදීම නිසා නිෂ්පාදන කටයුතු සහ ආදයම් පහත බැසීම.

4. පොදුවේ මෙම තත්ත්වය නිසා කුඩා බිම් කොටස්වල ඵලදාව අඩුවීම.

උදහරණයක් වශයෙන් රබර් ඉඩම්වල ඵලදාව සම්බන්ධයෙන් සලකා බැලීමේදී 1980 වර්ෂයේ හෙක්ටයාරයක ජාතික නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 817 ක් ව තිබියදී කුඩා ඉඩම්වල හෙක්ටයාරයක ඵළදාව කිලෝ ග්‍රෑම් 537 ක් විය.

දිවයිනේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සමුපකාර සංවිධාන බහුල වශයෙන් ඇති වීමට බලපෑ ප්‍රබල හේතු සාධකයක් ලෙස ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ආවේනික මෙම පොදු තත්ත්වයන් හැඳින්විය හැකිය. මෙම තත්ත්වය හමුවේ තනි තනිව ඉටු කල නොහැකි බොහෝ අවශ්‍යතා කුඩා පරිමාණයේ කෘෂිකාර්මිකයින් විසින් සපුරා ගන්නා ලද්දේ සමුපකාරිකයන් වශයෙන් සංවිධානය වීමෙනි.

---

සමුපකාර සහකාර කොමසාරිස්

**ඩබ්. පී. එස්. ජයවර්ධන**

**විසිනි.**

---

දිවයිනේ කෘෂිකාර්මික සමුපකාර සංවිධාන පිළිබඳ වැඩි දුරටත් සාකච්ඡා කිරීමේදී ඒ ඒ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ට අදළව කරුණු දක්වීම වඩා ප්‍රායෝගික වේ.

### ශ්‍රී ලංකවේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති

ශ්‍රී ලංකාවේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිවල ඉතිහාසය මෙම ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ ආයතනවලටද වඩා පැරණි වේ. කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මෙරට ආරම්භ වූයේ 1930 වර්ෂයේ සිටය. ප්‍රථමයෙන් පිහිටුවන ලද කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය බෝමිරිය කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතියවන අතර, ඉන්පසු යාපනයේද මෙබඳු සමිති හිටුවා ගන්නා ලදී. මෙම සමිති මගින් පාරිභෝගිකයින් සඳහා මෙන්ම රජයේ රෝහල්වලටද කිරි සැපයීම කරන ලදී. 1952 වනවිට එසේ පිහිටුවන ලද සමිති ඒකාබද්ධව කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමයක් පිහිටුවා ගන්නා ලද අතර, 1954 වර්ෂයේ ජාතික කිරි මණ්ඩලය පිහිටුවීමත් සමඟ මෙම සමිතිවලට අසතුටුදයක තත්ත්වයකට මුහුණ පෑමට සිදුවිය. ඊට ප්‍රධාන හේතුව මෙම සමිති විසින් ඉටු කරන ලද රෝහල් කිරි සැපයීම් කටයුතු ජාතික කිරි මණ්ඩලයට පැවරීමය. 1969 වර්ෂය වනවිට සමිති සංඛ්‍යාව 11 දක්වා පහත බසින ලද අතර, සංගමයේ කටයුතු ක්‍රියා විරහිත විය.

1971 වර්ෂයේ සිට කිරි නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ වූයේ විවිධ සේවා සමුපකාර සමිති වන අතර ගොවි සංවිධාන වශයෙන් කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිවල ක්‍රමවත් වර්ධනයක් ඇතිවූයේ 1978 වර්ෂයෙන් පසුවය. මෙම වර්ෂයේදී ශ්‍රී ලංකා කිරි පට්ටි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාතික පශු සම්පත් මණ්ඩලයේ මෙහෙයවීම ඇතිව පොල් ත්‍රිකෝණයේ හා මැදරට කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති පිහිටුවන ලදි. මෙයට අමතරව පොලොන්නරුව, අනුරාධපුරය, හම්බන්තොට, පුත්තලම වැනි දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් පදනමින් යුත් කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති බිහිවන්නට විය. මෙවැනි තත්ත්වයන් යටතේ 1980 වර්ෂයෙන් පසු කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිවල සහ සාමාජිකත්වයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 1980 සහ 1988 අතර කාලය තුළදී සමිති සංඛ්‍යාව 46 සිට 184 දක්වා වැඩිවී ඇති අතර සමාජික සංඛ්‍යාවද 12909, සිට 40,869 දක්වා ඉහල නැග ඇත.

### කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති වර්ධනය

ගොවි සංවිධාන වශයෙන් කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති වර්ධනය තවත් අවස්ථාවක් වූයේ ශ්‍රී ලංකා ආසියානු සංවර්ධන බැංකු පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොළඹ, ගම්පහ, කෑගල්ල, කළුතර, ගාල්ල යන දිස්ත්‍රික්කවල කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංවිධානය කිරීමය. මේ යටතේ ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටුවනු ලැබ ඇති සමිති සංඛ්‍යාව පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | සමිති සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 03 |
| කෑගල්ල | 03 |
| කළුතර | 01 |
| ගාල්ල | 02 |

ගොවි සංවිධාන වශයෙන් කිරි නිපද වන්නන්ගේ සමූපකාර සමිති වර්ධනයවී ඇති ආකාරය සැලකිල්ලට ගැනීමේදී ඒවා ව්‍යුහාත්මක වශයෙන් පහත සඳහන් පරිදි වර්ග කලහැක.

1. **කුඩා පරිමාණයේ ප්‍රාථමික සමිති:**

මෙම වර්ගයේ සමිති බොහෝ විට කුඩා ගම් දෙක තුනකට සීමා වන අතර, සාමාජික සංඛ්‍යා 100 ක් 150 ක් පමණ වේ. සමස්ථ සාමාජිකත්වය මහා සභාව වශයෙන් කටයුතු කරනු ලබන මෙම වර්ගයේ සමිති බොහෝ වශයෙන් පිහිටුවා ඇත්තේ පොල් ත්‍රිකෝණයේ සහ මහනුවර දිස්ත්‍රික්කය තුළය.

මෙබඳු සමිතිවල කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව එකකට සීමා වන අතර බොහෝ විට කාර්යාලය වශයෙන් පවත්වාගෙන යන්නේද මෙම මධ්‍යස්ථානයන්ම වේ.

2. **මධ්‍යම මට්ටමේ සමිති :**

ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශ වැනි බලප්‍රදේශ පදනම් කර ගත් සමිති මධ්‍යම මට්ටමේ සමිති ගණයට අයත්වේ. මෙම බල ප්‍රදේශය තුළ සමිතිය විසින් ක්‍රියාත් මක කරන එකතු කිරීමේ මධ්‍යස්ථාන ගණනාවක් ක්‍රියාත්මක වන අතර සාමාජික සංඛ්‍යාවද සිය ගණනකින් යුක්ත වේ. මෙබඳු සමිති මැදරට ප්‍රදේශයට අයත් නාවලපිටිය, හඟුරන්කෙත, වත්තේගම, හාරිස් පත්තුව වැනි ප්‍රදේශවල පිහිටුවා ඇත. මෙම වර්ගයේ සමිතිවලද සාමාජිකත්වය මහා සභාව වශයෙන් සැලකෙන සෘජු සාමාජිකත්ව ක්‍රමය ක්‍රියාත්මක වේ.

3. **දිස්ත්‍රික් මට්ටමේ සමිති:**

ව්‍යුහාත්මකව සලකා බලන විට මීළඟ වර්ගය වශයෙන් සැලකිය හැක්කේ දිස්ත්‍රික් මට්ටමින් පිහිටු වනු ලැබ ඇති සමිතිය. මෙම සමිති සාමාජිකයින් මහා සභාව නියෝජනය කරනුයේ විවිධ සේවා සමූපකාර සමිතිවල ක්‍රියාත්මක වන නියෝජන ක්‍රමය අනුවය. මේ සඳහා විවිධ සේවා සමූපකාර සමිති අතුරු ව්‍යවස්ථාවන්හි දක්වෙන පරිදි මෙම සමිතිවලද ප්‍රාදේශික බෙදු වෙන් කොට තිබේ. මෙවැනි සමිති පොළොන්නරුව, අනුරාධපුර, පුත්තලම, හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වේ.

4. **සංගම්**

ඉහත (1) (2) යටතේ දක්වෙන සමිති පදනම් කරගත් සංගම් පොල් ත්‍රිකෝණය, මොණරාගල, මැදරට, බින්තැන්නපත්තුව යන ප්‍රදේශවල දැනට ක්‍රියාත්මක වේ.

කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිති සංඛ්‍යාව සහ සාමාජිකත්වය පසුගිය වසර කිහිපය තුළ පුළුල් වශයෙන් වර්ධනය වී ඇතත් සාමාජිකත්වයට සහ සමිති වලට අදාලව මෙම ක්ෂේත්‍රය තුළ විසඳා ගත යුතු ප්‍රශ්ණ සමූහය පුළුල් වශයෙන් සාකච්ඡා කළ යුතුය. සමිති සඳහා

1. යෝග්‍ය ව්‍යුහාත්මක ක්‍රමයක් සැකසීම,
2. ක්ෂේත්‍රය සඳහා ජාතික මට්ටමේ සංවිධානයක අවශ්‍යතාවය,
3. කිරි සඳහා වන මිළ තීරණය කිරීමේදී සමූපකාර සමිති ක්ෂේත්‍ර යේ සහභාගිත්වය,
4. පෞද්ගලික අංශය යටතේ එකතු කරන මධ්‍යස්ථාන වලට පුද්ගලිකව කිරි සැපයීම තුළින් මතු වන දුෂ්කරතා,
5. කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාලව ලබාගත යුතු ශිල්පීය දැනුම,
6. ජාතික මට්ටමේ ආයතනවල නියෝජිත ධුරයට අමතරව සැකසුම් කටයුතු සඳහා පෙළඹ වීමේ අවශ්‍යතාවය.

යන කරුණු විශේෂ අවධානයට යොමු විය යුතු අවශ්‍යතා වේ.

මෙකී අවශ්‍යතා සඳහා සතුටුදායක ප්‍රතිඵල සමූපකාර ක්ෂේත්‍රය සඳහා අත්කර දිය හැකි නම් කිරි නිෂ්පාදන කටයුතුවල නිරත දහස් ගණන් ගොවීනට දැනට වඩා විශාල ප්‍රතිලාභ සමූපකාර සමිති වලින් ලැබිය හැකි වේ. පාරිභෝගික යින් සඳහා ද කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාලව දැනට වඩා නොයෙකුත් ඵලදායී සේවාවන් මෙම ක්ෂේත්‍රය තුළින් ලබා දීමට හැකිවනු ඇත.

**රබර් ඉඩම් හිමියන්ගේ සමූපකාර සමිති:**

සමූපකාර ක්ෂේත්‍රයේ පසුගිය දශකය තුළ බහුල වශයෙන් බිහි වූ සංවිධාන ක්‍රමයක් ලෙස රබර් ඉඩම් හිමියන්ගේ සමූපකාර සමිති හැඳින්විය හැක. රබර් වගාව සඳහා වෙන්ව ඇති බිම් ප්‍රමාණ යෙන් 50.1% ක් හෙක්ටයාර් 1.6 ට අඩු බිම් කොටස් වන අතර මෙම කුඩා රබර් ඉඩම්වල පලදාව ජාතික මට්ටමේ හෙක්ටයාර් එකක පලදාවට වඩා අඩු මට්ටමක ඇත. මෙම කුඩා ඉඩම් හිමියන්ගේ ඉඩම්වල නිපදවන ෂීට් රබර් වල ශ්‍රේණියද බොහෝ විට පහල ශ්‍රේණියට අයත් වේ. රබර් වගාව සඳහා වෙන්ව ඇති සීමිත ඉඩම් ප්‍රමාණය සලකා බැලීමේදී පලදාව අඩුවීමත්, නිපද වන ෂීට් රබර්වල ශ්‍රේණිය පහත වැටීමත් පොදු ප්‍රශ්නයක් වන අතර කුඩා ඉඩම් හිමියන්ගේ ආදායම් තත්ත්වය කෙරෙහිද මෙය අහිතකර බලපවත්වනු ලැබේ.

මෙම කුඩා රබර් ඉඩම්වල පලදාව වර්ධනය කර ගැනීමටත් නිපදවන ෂීට් රබර්වල තත්ත්වය ඉහල නැංවීමටත් තනි තනි කුඩා ඉඩම් හිමියන් වශයෙන් කටයුතු කිරීම බලවත් ප්‍රායෝගික ගැටළු වක් වන අතර මෙයට විසඳුමක් වශයෙන් පසුගිය කාලය තුළ කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමූපකාර සමිති සංවිධාන කිරීම බහුල වශයෙන් සිදු විය. රබර් වගා කෙරෙන ප්‍රදේශයන් හි පසුගිය කාලය තුළ පිහිටුවනු ලැබ ඇති කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමූපකාර සමිති පිළිබඳ විස්තරයක් පහත දක්වේ.

| **දිස්ත්‍රික්කය** | **කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමූපකාර සමිති සංඛ්‍යාව** | **සාමාජික සංඛ්‍යාව** |
|---|---|---|
| කොළඹ | 07 | 239 |
| කළුතර | 32 | 621 |
| කෑගල්ල | 20 | 865 |
| රත්නපුර | 13 | 385 |
| ගාල්ල | 2 | 137 |
| එකතුව | 74 | 2247 |

(28 වැනි පිටුව බලන්න.)

(12 පිටුවෙන්)

පොදුවේ මෙම කුඩා රබර් ඉඩම් හිමියන් ගේ සමුපකාර සමිති මගින්

1. ගොවීනට අවශ්‍ය පැල, පොහොර වැනි යෙදවුම් සැපයුම්.
2. වගා කටයුතු පිළිබඳ අවශ්‍ය දැනුම ලබා දීම.
3. පොදු සැකසුම් මධ්‍යස්ථානයකදී උසස් ශ්‍රෙණියේ ෂීට් රබර් නිපදවීම වැනි සේවා ක්‍රියාත්මක කරනු ලැබේ.

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ වගා කටයුතු වර්ධනය කර ගැනීමටද පලදාව සහ නිපදවන ෂීට් රබර්වල තත්ත්වය උසස් කර ගැනීමටද කුඩා රබර් ඉඩම් හිමියන් වශයෙන් සමුපකාර ව්‍යුහය යටතේ සංවිධානය වීම බෙහෙවින් පලදායක බව ප්‍රායෝගිකව පෙනී ගොස් ඇති අතර ඉදිරියේදී වැඩි වැඩියෙන් මෙසේ ගොවීන් වශයෙන් සංවිධානය වීම ඔවුන්ගේ යහපතට මෙන්ම ජාතික මට්ටමේ නිෂ්පාදන තත්ත්වයන්හී යහපතටද හේතු වනු ඇත.

ඉහත විස්තර කරන ලද පසුගිය දශකය තුළ කුඩා රබර් ඉඩම් හිමියන්ගේ සමුප කාර සමිති වර්ධනය කෙරෙහි ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ උපදේශක සේවා දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද රබර් සැකසුම් මධ්‍යස්ථාන පිහිටු වීමේ වැඩ පිළිවෙල ප්‍රධාන වශයෙන් හේතු වූ බව සඳහන් කළ යුතු වේ.

**පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති :**

කුඩා ඉඩම් හිමියන් වශයෙන් පොල් ඉඩම් හිමියන් සමුපකාර ක්ෂේත්‍රය තුළ සංවිධානය වීම මීට දශක හයක පමණ පෙර සිට සිදුවූවකි. 1947 වර්ෂයේදී පොල් ත්‍රිකෝණය තුළ පොල් නිපද වන්නන්ගේ සමුපකාර සමිති 42 ක් පමණ ක්‍රියාත්මක විය. මෙම වකවානුව තුළ සමිති සෑහෙන සංඛ්‍යාවක් කෑපූ පොල් නිෂ්පාදනයෙහි නිරතව කටයුතු කරන ලද අතර මේ සඳහා රජය මගින් ණය පහසුකම් පිරිනමන ලදී.

සමුපකාර ක්ෂේත්‍රය සඳහා වෙන් කර තිබූ ටොන් 5,000 ක පංගුකරය අහෝසි වීමත් සමගම පෞද්ගලික මෝල් සමග ඇතිවූ තරඟකාරී තත්ත්වයද පැවැත් වෙමින් තිබියදී 1956 පමණ වන විට බොහෝ පොල් නිපදවන්නන් ගේ සමුපකාර සමිති කෑපූ පොල් නිෂ්පාදන කටයුතු වලින් ඉවත් වීම දක්නට ලැබුණි.

වර්තමානයෙහි කුඩා පොල් ඉඩම් හිමියන් සඳහා සංවිධානය වූ සමුපකාර සමිති අතුරින් ප්‍රධාන වශයෙන් පහත සඳහන් පරිදි සමිති 11 ක් ක්‍රියාත්මක ව පවතී.

**සැකසුම් කටයුතුවල නිරත පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති**

සී.ස. මාරවිල පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය.
" දූනගහ "
" නාත්තන්ඩිය "
" සඳලංකාව "
" කම්මල්පත්තුව "
" කුරුණෑගල "

**සැකසුම් කටයුතුවල නිරත නොවන ග්‍රාමීය මට්ටමේ පොල් ඉඩම් හිමියන් ගේ සමුපකාර සමිති**

සී.ස. විජය කටුපොත පොල් නිපද වන්නන්ගේ සමුපකාර සමිතිය.
" බෝපිටිය "
" හේවිස්ස "
" මීනුවන්ගොඩ "
" නාරම්මල "

පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති ක්ෂේත්‍රයෙහි දැනට මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රධාන බාධකයක් වන්නේ මහා පරිමාණයේ කෑපූ පොල් නිෂ්පාදන කටයුතු සඳහා පෞද්ගලික කර්මාන්ත ශාලා පිහිටුවීමය. මේ යටතේ නවීන සූක්ෂම ශිල්ප ක්‍රම උපයෝගී කරගනු ලබන කෑපූ පොල් නිෂ්පාදන කර්මාන්ත ශාලා සමග තරඟ කිරීමට මෙම සමුපකාර සමිති වලට සිදුවනු ඇත. මේ සඳහා සමුපකාර සමිති ක්ෂේත්‍රයට ගත හැකි පියවර වනුයේ තරඟකාරීත්වයට සුදුසු වන පරිදි තම මෝල් නවීකරණය කිරීම හෝ සමුපකාර ක්ෂේත්‍ර සඳහා පොදුවේ මධ්‍ය පරිමාණයේ මෙබඳු කර්මාන්තශාලා ඇති කිරීමය. කෙසේ වෙතත් මේ සඳහා ද අවශ්‍ය අරමුදල් සහ තාක්ෂණය පිළිබඳ ප්‍රශ්ණ මතු වීමට ඉඩ ඇත. මෙයට අමතරව වෙනත් පොල් ආශ්‍රිත කර්මාන්ත සහ අපනයන කටයුතු වර්ධනය කර ගැනීම ගත හැකි තවත් පියවරක් වනු ඇත.